**ශීර්ෂය 118- කෘෂිකර්ම අමාත්‍යාංශය**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------------

කෘෂිකර්ම අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූලි 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 සැප්තැම්බර් 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-----------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික

විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වනනමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.
මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සමඟ අනුරූපවන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ආදයම් ලැබීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ වී මිලදී ගැනීම් වැඩසටහනෙහි පෙර වර්ෂයෙහි ගිණුම් අනුව හිඟ ආදායම රු.439,123,225 ක් වුවත් ප්‍රවර්තන වර්ෂයෙහි අවසන් ගිණුම් තුළ ඊට අතිරේකව තවත් රු.47,019,598 ක මුදලක් හිඟ ආදායම් ලෙස දක්වා තිබුණි. මේ අනුව වී මිලදී ගැනීමේ වැඩසටහනෙහි හිඟ ආදායම් පිළිබඳ විශ්වාසනීය වාර්තා පවත්වා ගැනීමක් සිදුව නොමැති බව නිරීක්ෂණය විය. | රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන 2018/19 මහා කන්නය සඳහා දිස්ත්‍රික්ක 20 ක ක්‍රියාත්මක කරන ලදී.2021/12/31 දිනට අයවිය යුතු හිඟ ආදායම රු.439,123,225.00 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරන ලද්දේ, මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලින් ලද තොරතුරු මත පදනම්ව වේ. කෙසේ නමුත්, රු.47,019,598.00 ක තව දුරටත් හිඟ ආදායමක් පවතින බවට දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් වාර්තා කරනු ලදුව එම මුදල මූල්‍ය ප්‍රකාශන තුළ පෙන්නුම් කරන ලදි. | හිඟ ආදායම්වල වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |
| (ආ) | උක්ත වී මිලදී ගැනීමේ වැඩසටහනෙහි පසුගිය වර්ෂයේ හිඟ ආදායමින් රු.138,204,923 ක් හා ප්‍රවර්තන වර්ෂය තුළ රු.209,107,022 ක හිඟ ආදායම් ඇතුළුව එකතුව රු.347,311,945 ක ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එම ශේෂ අය නොවීම මතභේදාත්මක විය. | මෙම හිඟ ආදායමින් 2022 වර්ෂය තුළ රු.81,244,687 ක් අයකර ඇති අතර තව දුරටත් අයවිය යුතු ආදායම රු.266,057,258 කි. | අය නොවීමට හේතු සොයා බලා කඩිනමින් හිඟ ආදායම් අයකරගත යුතුය. |

## 1.6.2 දේපළ පිරියත හා උපකරණ

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෘෂිකර්ම අමාත්‍යාංශයේ භාවිතයේ ඇති වෙනත් රාජ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අයත් වාහන 15 ක අයිතිය පවරා නොගෙන ඒවායේ රු.51,500,000 ක වටිනාකම, මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි. | වාහන 14 ක් මෙම අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට මේ වන විට කටයුතු කරමින් පවතී. එක් වාහනයක් එහි අයිතිය පවතින ආයතනයට නැවත භාර දීමට කටයුතු කළ යුතුය. ඒ අනුව ගිණුමට අදාළ ගැලපීම් සිදු කරනු ලැබේ. | වෙනත් රාජ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අයත් වාහනවල අයිතිය පවරා ගත යුතුය. |
| (ආ) | අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී ඇති එකතුව රු.77,500,000 ක් වටිනා එහෙත් අමාත්‍යාංශය භාරයේ නොමැති වාහන 14 ක් මූල්‍ය ප්‍රකාශ තුළ මූල්‍ය නොවන වත්කම් ලෙස නිරූපණය කර තිබුණි. | අමාත්‍යාංශය යටතේ ලියාපදිංචිව පැවති භාවිතයක් නොමැති වාහන 14 න් මේ වන විට පවරා දීම කර ඇති වාහනවල අගයන්, වත්කම් වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත. එසේම අනෙකුත් වාහන වල පවරා දීම සඳහා ඉදිරි කටයුතු කරමින් පවතී. | අමාත්‍යාංශ භාරයේ නොමැති වාහනවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනයෙන් ඉවත් කළ යුතුය. |
| (ඇ) | අමාත්‍යාංශයට හිමිකාරීත්වය පවතින අමාත්‍යාංශය විසින් භාවිතයට ගනු ලබන එකතුව රු.8,360,000 ක් වටිනා වාහන 04 ක් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම්වලට ඇතුළත් කර නොතිබුණි. | අදාළ වටිනාකම් ඉදිරියේ දී ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | වාහන මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයාගේ 2017 දෙසැම්බර් 21 දිනැති අංක 2/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව | මෙම වාහන අතුරින් වාහන 15 ක් වෙනත් අමාත්‍යාංශ/ආයතන නමින් ලියාපදිංචි වාහන වන අතර එම වාහන පවරා ගැනීමට හෝ නැවත භාරදීමට කටයුතු කරමින් පවතී. වාහන 24 ක් මෙම අමාත්‍යාංශය | අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි, වෙනත් අමාත්‍යාං හා දෙපාර්තමේන්තු විසින් භාවිතා කරනු ලබන වාහන එම ආයතනවලට පවරාදී මූල්‍ය ප්‍රකාශනවලින් |

අමාත්‍යාංශය විසින් වෙනත් අමාත්‍යාංශයක් වෙත වාහන පැවරීමේදී පැවරුම්ලාභී අමාත්‍යාංශයක් නමින් ලියාපදිංචි කර ගැනීමට අවස්ථාව ලබා දිය යුතු වුවත් එසේ නොකර කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි, වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් භාවිතා කරන රු.259,300,000 ක් වටිනාකම වූ වාහන 39 ක් මෙම අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි. රාජ්‍ය අමාත්‍යාංශවල විෂය පථය වරින් වර සංශෝධනය වෙමින් රාජ්‍ය අමාත්‍යාංශ අහෝසි වෙමින් නැවත මෙම අමාත්‍යාංශ වෙත එක් වෙමින් පවතින බැවින් නිශ්චිත වශයෙන් ඇතැම් වාහන එම රාජ්‍ය අමාත්‍යාංශ වෙත පවරා දීම ගැටලු සහගත නිසා එම වාහන කැබිනට් අමාත්‍යාංශය ලෙස මෙම අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් ලෙස තබා ගෙන සිටින බව වැඩිදුරටත් නිරීක්ෂණය කෙරේ.

යටතේ පැවති රාජ්‍ය අමාත්‍යාංශ වෙත අනුයුක්ත කළ වාහන වේ. එම රාජ්‍ය අමාත්‍යාංශවල විෂය පථය වරින් වර සංශෝධනය වෙමින් රාජ්‍ය අමාත්‍යාංශ අහෝසි වෙමින් නැවත මෙම අමාත්‍යාංශ වෙත එක් වෙමින් පවතින බැවින් නිශ්චිත වශයෙන් එම රාජ්‍ය අමාත්‍යාංශ වෙත වාහන පවරා දීම ගැටළු සහගතය. එම නිසා එම වාහන කැබිනට් අමාත්‍යාංශය ලෙස මෙම අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් ලෙස තබාගෙන රාජ්‍ය අමාත්‍යාංශ වෙත අනුයුක්ත කිරීමට කටයුතු කර ඇත.

ඉවත් කළ යුතුය.

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 ආදායම් කළමනාකරණය

----------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ආදායම සංකේත 2003.07.00 දරන රජයේ වී මිලදී ගැනීමේ වැඩ සටහන යටතේ රැස්කර ගැනීමට ඇස්තමේන්තු කර තිබුණු ආදායම රු.1,500,000,000 ක් වුවත් රැස්කළ ආදායම රු.453,206,587 ක් වූ අතර එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 30 කි. | පෙර වර්ෂයේදී දිස්ත්‍රික්ක 20 ක මෙම වැඩසටහන ක්‍රියාත්මක කර තිබු බැවින්, ඒ මත පදනම්ව ආදායම් ඇස්තමේන්තු සකසන ලදී.නමුත්, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් අදාළ වැඩසටහන දිස්ත්‍රික්ක 4ක පමණක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර, ඒ අනුව දිස්ත්‍රික් ලේකම් වරුන් වෙත ප්‍රතිපාදන වෙන්කර දී තිබු හෙයින් සකසන ලද ආදායම් ඇස්තමේන්තුවේ අගයන් රැස්කළ ආදායමට සාපේක්ෂව සංඛ්‍යාත්මකව වෙනස් විය. | වර්ෂයට අදාළ ඇස්තමේන්තුගත වැඩසටහන් ක්‍රියාත්මක කර ආදායම් රැස් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 2.2 වියදම් කළමනාකරණය

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | වර්ෂය ආරම්භයේ සිටම ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර නොතිබීම නිසා ප්‍රාග්ධන වැය විෂයයන් 03ක එකතුව රු.278,000,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. | අංක 21/1520/320/154 හා 2021.08.31 දිනැති වියදම් සමාලෝචනය සඳහා වූ අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව කටයුතු කිරීම මත අවුරා තැබීම් සිදු කිරීම. ව්‍යාපෘතියට අදාළ කිරි සැකසුම් යන්ත්‍රෝපකරණ තාවකාලික පදනම මත (Provisional Basis) බදු අයකිරිමකින් තොරව ශ්‍රී ලංකා රේගුවවිසින් නිදහස් කරන ලද අතර, ද්විතිකව | මු.රෙ.50 විධිවිධාන ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අදාළ ගණනයන් සිදු කොට ගෙවිය යුතු බදු මුදල් පිළිබඳ වාර්තාවක් 2021 වර්ෂයේදි ඉදිරිපත්ව නොමැත. තවද, ව්‍යාපෘති කාර්යය මණ්ඩලයක් තෝරා ගැනිමේ කාර්යය සම්පූර්ණ නොවීම හේතුවෙන් අදාල පරිපාලන වියදම් සඳහා ගෙවීම් සිදු කර නොමැත. | |
| (ආ) | ඇස්තමේන්තු සැකසීමේදී නිවැරදි පුරෝකථන සිදු නොකිරීම හේතුවෙන් ප්‍රාග්ධන වැය විෂයයන් 20 ක හා පුනරාවර්තන වැය විෂයයන් 16 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13 ක සිට 99 ක් දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. උක්ත ප්‍රාග්ධන හා පුනරාවර්ත වැය විෂයයන් සඳහා සලසා තිබූ ශුද්ධ ප්‍රතිපාදනය රු.8,395,977,000 ක්වූ අතර ඉන් රු.4,540,336,242 ක් එනම් සියයට 54 ක් ඉතිරි වී තිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය මත සංවරණය සීමා කිරීම මත ඉතිරිවීම් සිදුවීම. නිල ඇඳුම් දීමනාව ලබාගැනීමට සුදුසුකම් ඇති නිලධාරීන් අඩුවීම මත හා අංක 21/1520/320/154 හා 2021.08.31 දිනැති වියදම් සමාලෝචනය සඳහා වූ අමාත්‍ය මණ්ඩල සංදේශය පරිදි අවුරා තැබීම් කර ඇත. අංක 21/1520/320/154 හා 2021.08.31 දිනැති වියදම් සමාලෝචනය සඳහා වූ අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව වියදම් පාලනය කිරීම. | මු.රෙ.50 විධිවිධාන ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු සකස් කළ යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

**නිරීක්ෂණය**

---------------

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | -------------------- | --------------- | ------------------ | ------------ |
| (අ) | 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන භාණ්ඩාගාර නියෝජ්‍ය | ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරන වාහන, ලියාපදිංචි අයිති | වාහන 16 මේ වන විට පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. ලෝක ආහාර | ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරන වාහන, ලියාපදිංචි |

| | | | |
|---|---|---|---|
| ලේකම්වරයාගේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | ආයතනයේ එකඟතාවය මත, තම ආයතනයේ නමින් ලියාපදිංචි කරගැනීමට හෝ ලියාපදිංචි අයිතිය ඇති ආයතනය වෙත විධිමත්ව පවරාදීමට කටයුතු කළ යුතු නමුත් චක්‍රලේඛය ප්‍රකාරව පවරා ගැනීමට හෝ නැවත භාරදීමට කටයුතු නොකළ වෙනත් ආයතනයන්හි හිමිකාරීත්වයට යටත් වාහන 25ක් කෘෂිකර්ම අමාත්‍යාංශ භාවිතයේ පවතී. | හා කෘෂිකර්ම සංවිධානයට අයත් JZ – 5973 දරන වාහනය පවරාගැනීමට හැකියාවක් නොමැති බැවින් දැනට එම වාහනය අනුයුක්ත කර ඇති නිලධාරියාට සුදුසු වාහනයක් අනුයුක්ත කල පසු නැවත භාරදීමට කටයුතු කරනු ලැබේ. KJ – 6251 හා KJ – 2652 දරන වාහන නිල වාහන ලෙස අනුයුක්ත කර ඇති අතර එම වාහන වල හිමිකාරිත්වය මෙම අමාත්‍යාංශයට පැවරීමට මහජන ආරක්ෂක අමාත්‍යාංශයෙන් එකඟ වී නොමැත. එබැවින් එම නිලධාරීන් වෙත අනුයුක්ත කිරීමට සුදුසු වාහන ලැබුණු පසු නැවත භාරදීමට කටයුතු කරනු ලැබේ.මෙම අමාත්‍යාංශය යටතේ පැවති වාහන 4 ක් රාජ්‍ය අමාත්‍යාංශවලට අයත් වාහන වන බැවින් පවරා ගැනීමේ අවශ්‍යතාවයක් නොමැත. වාහන 02ක පවරාගැනීමට ඉදිරියේ දී කටයුතු කිරීමට නියමිතය. | අයිති ආයතනයේ එකඟතාවය මත අමාත්‍යාංශයේ නමින් ලියාපදිංචි කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 1646 | වාහනවල ගමන් පිළිබඳ මාසික සාරාංශවල මුල් පිටපත් හා ධාවන සටහන් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර විගණකාධිපති වෙත එවිය යුතු වුවත් 2021 වර්ෂයට අදාළව අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා නිල වාහන 13 ක මාසික සාරාංශයද, 2021 මාර්තු සිට දෙසැම්බර් දක්වා සංචිත වාහන 26 ක ධාවන සටහන් හා මාසික සාරාංශ 2022 ආප්‍රේල් 07 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂයේ රටතුළ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් සංචරණ සීමා පැනවීම හා නිලධාරීන් මෙන්ම රියදුරන්ද කාර්යාලය වෙත ගෙන්වීම සීමා වූ බැවින් ධාවන සටහන් හා මාසික සාරාංශ ඉදිරිපත් කිරීම ප්‍රමාද වූ අතර, ඒ සමහම 2022 වර්ෂයේ ධාවන සටහන් හා මාසික සාරාංශ පරික්ෂා කිරීමේ කටයුතු සිදු කළ යුතුව තිබුණු බැවින් ප්‍රමාදවීම් සිදුවී ඇත. | වාහන දෛනික සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 2.4 බැරකම් හා බැදීම්වලට එළඹීම

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශයේ මූලධන වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.1,000,000,000 ක ශුද්ධ ප්‍රතිපාදනය වර්ෂය තුළ සම්පූර්ණයෙන්ම උපයෝජනය කර තිබුණි. එසේ වුවත් එම වැය විෂයය සඳහා ප්‍රතිපාදන නොතිබියදී, රු.3,250,000,000 ක බැරකම් සඳහා බැදීම් ඇති කර ගෙන තිබුණි. | 118/2/3/43/2202 වැය විෂය සඳහා ගොවීන් වෙත ගෙවීමට නියමිතව තිබූ වන්දි වෙනුවෙන් වන බැරකම උත්පාදනය වී පැවතුණි. නියමිත වටිනාකම් අනුව ප්‍රතිපාදන ඉල්ලුම් කල ද ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් 2021 වසර සඳහා ලබාදෙන ලද්දේ රු.මි.1000 ක මුදලක් පමණි. ඒ අනුව, ගිණුමේ ප්‍රතිපාදන ඉක්මවූ බැරකම් ලෙස අදාළ වටිනාකම් දැක්වීමට සිදු වී ඇත. | මු.රෙ.94 ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා බැරකම් හා බැදීම් ඇතිකර නොගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට | විමසුමේ සඳහන් අගයන් | සමාලෝචිත වර්ෂයට අදාළ |

| | | | |
|---|---|---|---|
| | අදාළ රු.283,686 ක්වූ බැරකම් මූල්‍ය ප්‍රකාශනවල බැරකම් හා බැදීම් ප්‍රකාශයට සටහන් අංක (iii) ඇතුළත් කර නොතිබුණි. | බැරකම් ලෙස ඇතුළත් කිරීමට නොහැකි වී ඇත්තේ අදාළ බිල්පත් පසුව ඉදිරිපත් වන බැවිනි. කෙසේ නමුත් හැකිතාක් නිවැරදි සංඛ්‍යා ගිණුමේ ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | සියලුම බැදීම් හා බැරකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |
| (ඇ) | වගා හානි සඳහා වන්දි ලබා දීම පිණිස 118-2-3-43-2202 වැය විස්තරය යටතේ 2020 හා 2021 වර්ෂ වලදි පිළිවෙලින් රු. මිලියන 1,514 ක් හා රු.මිලියන 1,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර අදාළ වර්ෂයන්හිදී උක්ත මුළු ප්‍රතිපාදන වටිනාකම කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත ලබාදී තිබුණි. ලියාපදිංචි ගොවීන්, වන්දි ලබා ගැනීමට අදාළ වගා හානිවූ ගොවීන් හා වන්දි ගෙවීම් ලද ගොවීන් ඇතුළුව උක්ත මුදල් උපයෝජනය සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය පසු විපරම් කර නොතිබුණු අතර වන්දි ගෙවීම් සඳහා බැරකමක් ජනනයවූ බවට සම්බන්ධ කිසිදු ලිඛිත සාක්ෂි ලබා ගැනීමකින් තොරව කෘෂිරක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් ලබා දුන් ලිපියක් පදනම් කර ගනිමින් 3,250,000,000 ක බැරකම් ගිණුම්ගත කර තිබුණි. | අදාළ 118/2/3/43/2202 වැය විෂය සඳහා වන සම්බන්ධීකරණ කටයුතු කෘෂි සංවර්ධන අංශය මගින් සිදු කරන අතර, ඊට අදාළ ගොනුවේ අදාළ තොරතුරු අන්තර්ගතව පවතී. වන්දි මුදල් ගෙවීම, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මගින් කළ යුතු නිසා මුදල් නිදහස් කිරීම එම ආයතනය මගින් සිදුකල යුතු අතර, රජය සතු ආයතනයක් වන හෙයින් සියළු රෙගුලාසි අනුගමනය කරමින් ගෙවීම් කටයුතු සිදු කර ඇත. | වගා හානි සඳහා වන්දි ගෙවීමට අදාළ ලිඛිත සාක්ෂි ලබා ගත යුතුය. |

**2.5 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

-----------------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ----------------------------- | --------------- |
| මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්යය අතුරු අග්‍රිමය නිරවුල් කළයුතු වුවත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරීන් 23 දෙනෙකු විසින් අවස්ථා 53 කදී ලබාගෙන තිබුණු රු.892,540 ක අතුරු අග්‍රිම පියවීමට දින 02 ක සිට දින 106 ක් දක්වා කාල පරාසයක් ගෙන තිබුණි. | මේ සම්බන්ධයෙන් සියලු නිලධාරින් නිරන්තර දැනුවත් කිරීම් සිදු කරනු ලබන අතර, අභ්‍යන්තර චක්‍රලේඛ මගින්ද දැනුම්දීම් සිදු කර ඇත.කෙසේ නමුත් විගණන විමසුමේ අදාළ නිලධාරීන්ගෙන් ප්‍රමාදවීම පිළිබඳව හේතු දක්වන ලෙස ද දන්වා යවන ලදී.තවදුරටත් මේ පිළිබඳව නිසි සුපරීක්ෂණය කර අදාළ අත්තිකාරම් කඩිනමින් පියවාගැනීමට උපදෙස් ලබා දී ඒ අනුව කටයුතු කරනු ලැබේ. | මු.රෙ. 371 (5) විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.6 පාඩු හා අත්හැරීම්**

-------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ---------------------------------- | ------------------- |
| රජයේ නිලධාරීන්ගේ රු.44,596 ක අත්තිකාරම් ණය ශේෂ 2 ක් 2021 වර්ෂය තුළ කපා හැර තිබුණු අතර එම ණය ශේෂ පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනයේ පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ සටහන (i) තුළ ඇතුළත් කර නොතිබුණි. | අතපසුවීමකින් එම සංඛ්‍යාව ඇතුළත්ව නොමැත. | පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ දුර්වලතා**

**3.1.1 කෘෂිකර්ම අමාත්‍යාංශයට ලබගත් ගොඩනැගිල්ලේ කුලී ගිවිසුම අවසන් කිරීම**

කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා කුලියට ගත් ගොඩනැගිල්ලේ අයිතිකාර පෞද්ගලික සමාගම හා කෘෂිකර්ම අමාත්‍යාංශය අතර වූ අංක 2178 දරන බදු ගිවිසුම අහෝසි කිරීම සහ රු.මිලියන 63 ක ආපසු ගෙවිය යුතු තැන්පත් මුදල් නිදහස් කර ගැනීම සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බදු ගිවිසුම් කාලය අතරතුර අවශ්‍ය වුවහොත් බදු ගැනුම්කරුට සහ බදු දීමනාකරුට ගිවිසුම අවසන් කළ හැකි ආකාරය පිළිබඳ කොන්දේසියක් බදු ගිවිසුමට ඇතුළත්ව නොතිබුණි. එම අඩුපාඩුව නිසා වසර 5 කට බදුගත් මෙම දේපළ සිව්වන අවුරුද්දේදී ආපසු භාර දෙන අවස්ථාවේ ඉතිරිව ඇති බදු කාලයට සමානුපාතිකව කුලී ප්‍රමාණයක් අඩු කර ගැනීමට අවස්ථාව අහිමිව ගොස් තිබුණු අතර ගොඩනැගිල්ල භාවිතා නොකළ කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.310,939,139 ක බදු මුදලක් ගෙවා තිබුණි. එම වියදම අනාර්ථික වැයක් ලෙස නිරීක්ෂණය විය. | ගිවිසුම් ගත කාලයට පෙර විධිමත් දැනුම් දීමකින් පසු පරිශ්‍රයෙන් ඉවත්ව බදු ගිවිසුම අවසන් කිරීමට කෙටි කාලයක් ප්‍රමාණවත් නොවේ. අමාත්‍යාංශයේ සියළු නිලධාරීන්, ඒ ඒ අංශ වෙන වෙනම ස්ථාන ගත කිරීමට හා ගොවිජන මන්දිර ගොඩනැගිල්ල, පාර්ලිමේන්තු මහ ලේකම්වරයා වෙතින් නැවත පවරා ගෙන කෘෂිකර්ම අමාත්‍යාංශය ස්ථාපිත කොට කාර්යාලීය පරිසරයට උචිත ආකාරයට පරිවර්ථනය කිරීම සඳහා යම් කාලයක් ගත විය. තව ද, බදු පරිශ්‍රයේ නිර්බාධ භුක්තිය පැවරීමට අවශ්‍ය තත්වය ඇති කිරීමට එකී කාල සීමාව තුළ අවශ්‍ය කටයුතු කරන ලදී. කෙසේ නමුත් සියළු කටයුතු කරන ලද්දේ ගිවිසුමේ වගන්ති වලට අනුව වේ. | මෙවැනි වියදම් නොදැරීමට වගබලාගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) බදු කාලය තුළ බදුගැණුම්කාර පාර්ශවය වෙතින් බදු ගොඩනැගිල්ලට සිදුවී ඇති හානිය සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙහි ඉංජිනේරු අංශයේ නිලධාරීන් හා තක්සේරු දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන් එක්ව 2021 මාර්තු, අප්‍රේල් කාලය තුළ පරීක්ෂාවක් සිදුකර ඇති අතර, උක්ත පරීක්ෂාව සඳහා සහභාගී වන ලෙස බදු දීමනාකාර පාර්ශවය වෙත දැනුම්දී ඇතත්, බදු දීමනාකාර සමාගම උක්ත පරීක්ෂාව සඳහා සහභාගීවීම ප්‍රතික්ෂේපකර ඇත. බදු දේපළෙන් ඉවත්වීමේදී දෙපාර්ශවයේ සහභාගීත්වයෙන් සුදුසු තාක්ෂණික ආයතනයක් මගින් අලාභහානි වාර්තාවක් කැඳවිය යුතු බවට ගිවිසුම තුළ කොන්දේසි ඇතුළත්කර නොතිබීම හේතුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයෙහි නිලධාරීන් විසින් සිදු වී ඇති හානිය ලෙස රු.12,710,236 කටත් බදු දීමනාකාර සමාගම ගොඩනැගිල්ලට සිදුවූ හානිය රු.28,250,056 කටත් තක්සේරුකර වාර්තා සකස් කිරීම හේතුවෙන් පාර්ශවයන් අතර හානි පාඩු සම්බන්ධයෙන් මතභේදාත්මක තත්ත්වයන් නිර්මාණය වී ඇති අතර කෘෂිකර්ම අමාත්‍යාංශයේ කිසිදු සහභාගීත්වයකින් | බදු ගිවිසුම අවසන් වී ගොඩනැගිල්ල භාරදීමට ප්‍රථම ගොඩනැගිල්ලට සිදු වී ඇති හානිය හඳුනාගෙන ඒ සඳහා හානිය ගණනය කිරීමට සුදුසු ආයතනයක් වෙත භාරදීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා DPJ ආයතනයට අමාත්‍යාංශය හා එක්ව එම පරීක්ෂාව සිදු කිරීම සඳහා සහභාගී වන ලෙස දැනුම් දුන්න ද, එම ආයතනය එම අවස්ථාවට සහභාගී නොවූ බැවින්, අමාත්‍යාංශයේ ඉංජිනේරු අංශය මඟින් සිදු වී තිබූ හානිය හඳුනාගෙන ඒ සඳහා දළ ඇස්තමේන්තුවක් සකස් කරන ලදී. අනතුරුව DPJ ආයතනය විසින්ද හානිය ගණනය කර වාර්තාවක් ඉදිරිපත් කර ඇති බැවින්, එම වාර්තා දෙක අතර මතභේදාත්මක තත්වයක් ඇති විය. එබැවින්, මෙම ගොඩනැගිල්ලට සිදු වී ඇති හානිය ගණනය කර වාර්තාවක් ලබාදීම සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබාදෙනු ලබන වාර්තාවට අනුව ගොඩනැගිල්ලට සිදු වී ඇති හානිය සඳහා ගෙවීම් සිදුකරන බැවින්, අමාත්‍යාංශය හෝ DPJ ආයතනය විසින් ලබා දී ඇති වාර්තාවන් මත පදනම්ව වැඩිපුර ගෙවීමේ අවධානමක් පිළිබඳව නිගමනය කළ නොහැකිය. | මෙවැනි අනාර්ථික වැය නොදැරීමට වගබලාගත යුතුය. |

| | | |
|---|---|---|
| තොරව බදු දීමනාකාර විසින් ඒකපාර්ශවීය පිළියෙල කරන ලද තක්සේරු වාර්තාවකට අනුව රු.15,539,820 ක වැඩිපුර බැරකමක් ඇතිවීමේ අවදානමක් නිර්මාණය වී තිබුණි. | | |
| (ඇ) ගිවිසුම් කොන්දේසි අංක II අනුව ගිවිසුම අවසන්වී බදු දේපළ භාරදීමෙන් එක් මසක කාලයක් තුළ බදු දීමනා කරු විසින් රු.මිලියන 63 ක ආපසු ගෙවිය යුතු තැන්පතු මුදල බදුගැණුම්කරු වෙත ලබා දීමට කටයුතු කළ යුතු වේ. එහෙත් බදු ගැණුම්කරු බදු දේපළ භාරදී ගිවිසුම අවසන් කිරීමට ක්‍රියාකරන ලද සෑම අවස්ථාවකදීම බදු දීමනාකාර පාර්ශවය ඊට එරෙහිවීම හා ගිවිසුමේ මූලික කොන්දේසිවලට අනනුකූලව ක්‍රියාකරමින් ඇති නිසා උක්ත තැන්පතුව ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | අදාළ ගිවිසුම ප්‍රකාරව දේපළේ නිරවුල් භුක්තිය භාර දීමෙන් අනතුරුව තැන්පත් මුදල් බදු ගැනුම්කරු වෙත ආපසු ගෙවිය යුතු වේ. නමුත් රුපියල් මිලියන 63 ක තැන්පතු මුදල එකඟ වූ පරිදි DPJ ආයතනය නොගෙවූ අතර අවස්ථා කිහිපයකදීම DPJ ආයතනය වෙත ලිඛිතව දැනුම් දුන් අතර ඔවුන් ද ඊට ප්‍රතිචාර දක්වා ඇත. නමුත් එකී පාර්ශවයන් ඉදිරිපත් කර ඇති කරුණු පිළිගත් නොහැකි බැවින් තැන්පත් මුදල අය කර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වීමට අමාත්‍යාංශයට සිදුව ඇත. ඒ අනුව මේ වන විට නීතිපති දෙපාර්තමේන්තුව DPJ ආයතනය වෙත එන්තරවාසි යවා ඉදිරි කටයුතු කරමින් පවතී. | තැන්පතු මුදල අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.1.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ අය නොවූ ශේෂ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2020 ගිණුම් වර්ෂයේදී රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ශේෂ ලැස්තුව හා සැසඳුම් ප්‍රකාශනය අනුව ශේෂය අතර රු.1598 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර | අදාළ වෙනස මේ වර්ෂයේදී ගිණුම් ගැලපීම් කර නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | වෙනසට හේතු සොයා අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂයේදී එම වෙනස රු.1610 ක්ව පැවතිය අතර මෙම දෝෂය නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි. | | |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2015 හා 23/2020ට අනුව අත්තිකාරම් ලබා දුන් දින සිට මාස 10 කදී අදාළ ගිණුම් වර්ෂය තුළ අය කර ගෙන අවසන් කළ යුතු වුවත් කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්තව සේවය කරන නිලධාරින් 4 දෙනෙකු වෙත 2020 වර්ෂයේදී ලබා දී ඇති එකතුව රු.16,000 ක විශේෂ අත්තිකාරම් ශේෂයන් ප්‍රවර්තන වර්ෂය අවසාන දින වන විටත් අයකර ගැනීම ආරම්භකර හෝ නොතිබුණි. | 2020 දෙසැම්බර් මස මෙම ශේෂය කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය වෙත නිරවුල් කර ඇති අතර පසුව එම වාරික අයවීම් ගිණුමට ගැලපුව ද අතපසුවීමකින් කේවල ශේෂ නිවැරදිව ගැලපීම් කර නොමැත. අදාළ නිවැරදි කිරීම් මෙම වර්ෂයේදී සිදු කරනු ඇත. | ණය වාරික අයකරගත යුතුය. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2015 ට අනුව ලබාදුන් දින සිට මාස 08 ක් තුළ උත්සව අත්තිකාරමේ අයකර ගත යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත නිලධාරින් 07දෙනෙකු වෙත 2021 අප්‍රේල් මාසය තුළ ලබා දී ඇති එකතුව රු.70,000 ක උත්සව අත්තිකාරම් මුදලින් ගිණුම් වර්ෂය තුළ කිසිදු අයකිරීමක් සිදු කර නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලට ලබා දී අය නොවී ඇති උත්සව අත්තිකාරම් ණය ශේෂ අතුරින් නිලධාරීන් දෙදෙනෙකුගේ ණය වාරික ලැබීම් 2021 වර්ෂයේදී වී හා ධාන්‍ය රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර, එම ණය වාරික 2022 අප්‍රේල් මස මාසික ගිණුම් සාරාංශ මගින් අත්තිකාරම් බී ගිණුමට ගලපා ඇත.ඉතිරි නිලධාරීන් 5 කගේ අයවිය යුතු ශේෂ පිළිබඳව පරීක්ෂා කර කඩිනමින් අයකර එවීම සඳහා දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලිපි යොමු කර, ක්‍රියා කරමින් පවතී. | ණය වාරික අයකරගත යුතුය. |
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන් වෙත අනුයුක්ත කර ඇති නිලධාරීන් 07 දෙනෙකු වෙත 2020 වර්ෂයේදී | මෙම ශේෂයන්හි ඇතුලත්ව ඇති කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දුන් රු.2400.00 ක විශේෂ අත්තිකාරම් හිඟ ණය වාරික | ණය අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලබා දී තිබුණු උත්සව අත්තිකාරම් හා විශේෂ අත්තිකාරම් මුදලින් 2021 වර්ෂයේදී අයකර ගතයුතුව තිබුණු රු.14,850 ශේෂයෙන් ප්‍රවර්තන වර්ෂය තුළ කිසිදු අයකිරීමක් සිදු කර නොතිබුණි. | මෙම වර්ෂයේ මාර්තු මස තුළදී අය කර අවසන් කොට ඇත.ඉතිරි ණය ශේෂයන් පියවා ගැනීම සඳහා අදාළ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත කරුණු විමසා ලිපි යොමු කර ඇති අතර, ඉදිරියේදී එම ණය වාරික අය කර ගැනීම සඳහා කටයුතු කරනු ඇත . | |
| (ඉ) | කෘෂිකර්ම අමාත්‍යාංශයට අනුයුක්තව දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සේවයේ නියතු නිලධාරීන් 27 දෙනෙකුගෙන් වැරදීමකින් වැඩිපුර අයකරන ලද එකතු වටිනාකම රු. 127,960 ක ශේෂය එම නිලධාරීන් වෙත නැවත ගෙවීම සඳහා කටයුතු කිරීමකින් තොරව වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ වෙත නිරවුල් කළයුතු ශේෂයන් ලෙස දක්වා ගිණුම් පිළියෙල කර තිබුණි. | එම නිලධාරීන් 27 දෙනා අතුරින් කෘෂිකර්ම අමාත්‍යාංශයේ සේවය කරනු ලබන නිලධාරීන් 02 ගේ වැඩිපුර අය වූ රු.1600.00 ණය ශේෂය නැවත ගෙවීම සඳහා ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. තව ද, කෘෂිකර්ම අමාත්‍යාංශයට අනුයුක්තව සිට වී හා ධාන්‍ය රාජ්‍ය අමාත්‍යාංශය වෙත ස්ථාන මාරු වූ නිලධාරීන් 12 ගේ ණය වාරික අයවීම් රු.54,813.00 ක් වන අතර එම ණය වාරික අප්‍රේල් මස ගිණුම් සාරාංශය මගින් කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය වෙත නිරවුල් කර ඇත. ඉතිරි නිලධාරීන් ගේ වැඩිපුර අය වූ ණය වාරික එම නිලධාරීන් සේවය කරනු ලබන දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල පවත්වා ගෙන යනු ලබන ගිණුම් වාර්තා සමග සසඳා තහවුරු කර ගැනීම් වලින් අනතුරුව නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. | ශේෂ අප්‍රමාදව නිරවුල් කළ යුතුය. |
| (ඊ) | අමාත්‍යාංශ ස්ථිර කාර්යය මණ්ඩලයට අයත් නොවන අමාත්‍යවරයෙකුගේ රියදුරකු ලෙස කටයුතු කළ පුද්ගලයකු වෙත ලබාදී තිබූ උත්සව අත්තිකාරම් මුදල වූ රු.5,000 ක අගයෙන් කිසිදු වාරික ගෙවීමකින් තොරව සේවය අතහැර ගොස් තිබුණි. වසර 3 | කෘෂිකර්ම අමාත්‍යාංශයේ අමාත්‍ය කාර්ය මණ්ඩලයේ සේවය කරනු ලැබූ රියදුරු ජේ.පී.ගමගේ මහතා 2018 වසරේ ලබාගත් උත්සව අත්තිකාරම් මුදලක් වන අතර, එම ශේෂයෙන් රු.5000.00 ක ශේෂයක් තව දුරටත් අයවිය යුතු අතර, අදාළ ණය අයකර ගැනීම සඳහා නිරන්තර දැනුම් දීම් සිදුකර ඇති අතර ඒ අනුව ණය අයකර ගැනීමට කටයුතු | ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.3 ඡේදයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| කට අධික කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂය වගකිවයුත්තන්ගෙන් අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | කරමින් පවතී. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කෘෂිකර්ම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 12 ක්ද, තෘතියික මට්ටමේ තනතුරු 5 ක්ද, ද්විතියික මට්ටමේ තනතුරු 48 ක්ද, සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 13 ක්ද, පුරප්පාඩුව පැවතියද, එම තනතුරු වලට බඳවා ගැනීමට හෝ කාලීනව අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු පිරවීමට අදාළව පත්වීම් බලධරයන් දැනුවත් කර ඇති අතර, තෘතියික මට්ටමේ පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දී ඇත. එලෙස නිලධාරීන් ලබාදීමේ දී අදාළ තනතුරුවලට අනුයුක්ත කරනු ලැබේ. 2021-12-31 දිනට ද්විතියික මට්ටමේ තනතුරු පුරප්පාඩු 200 ක් පැවති අතර, එයින් බහුතරයක් (152) සංවර්ධන නිලධාරී සේවයේ පුරප්පාඩු විය. ඒ අනුව 2022 වර්ෂයේ සිදු කරන ලද නවක සංවර්ධන නිලධාරී බඳවා ගැනීම සමග එම පුරප්පාඩු සම්පූර්ණ කර ඇත. තවදුරටත් ඒ අතුරින් ආශ්‍රිත සේවා තනතුරු පුරප්පාඩු 31 ක් පවතින අතර, එම තනතුරු යටපත් කිරීම සම්බන්ධයෙන් කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත නිර්දේශ කර යැවීමට නියමිතය. ප්‍රාථමික මට්ටමේ පවතින කාර්යාල සේවක සේවයේ සහ රියදුරු සේවයේ තනතුරු පුරප්පාඩු සඳහා අනියම් පදනමින් බඳවා ගැනීම අවශ්‍යතාවය අනුව සිදු කළ ද, මේ වන විට නව බඳවා ගැනීම සිදු කළ නොහැක. එමෙන්ම, පුස්තකාල සහයක තනතුර සඳහා බඳවාගැනීමේ පටිපාටිය අනුමත කරවා ගැනීම සඳහා යොමු කර ඇත. | පුරප්පාඩු පිරවීමට හෝ වර්තමාන අවශ්‍යතාවයට සරිලන සේ සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට පියවර ගත යුතුය. |